මැතිවරණ කොමිෂන් සභාවේ සාමාජික මහාචාර්ය රත්නජීවන් හූල් සම්බන්ධයෙන් පසුගිය කාලය පුරාවට බොහෝ පුවත්පත් ලිපි හා වාර්තා පළ වූ අතර, එම ඇතැම් පුවත් වාර්තා හා ලිපි අතර දක්නට ලැබුණු ඒකපාර්ශවීය වාර්තාකරණය අපි මින් පෙරද සංවාදයට භාජනය කර ඇත්තෙමු.

මහාචාර්ය හූල් සහ නිරෝධායනයේ සිටි ඔහුගේ දියණිය මැතිවරණ නීති කඩමින් මැතිවරණ කොමිෂන් සභා කාර්යාලයට පැමිණුනේය යන්නත්, කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් හූල් හට දින 14 ක නිරෝධායන කාලයකට පසුව කොමිෂන් සභා කාර්යාලයට පැමිණෙන ලෙස පැවසූ බවත්, හූල්ට එරෙහිව නැගුණු අතිබහුතරයක් චෝදනාවන්ට ප්‍රස්තුත විණි.

කෙසේ නමුත් මැයි 21 වන දින කලම්බු ටෙලිග්‍රාෆ් ඔස්සේ ලිපියක් පළ කරමින් මහාචාර්ය හූල් විසින් මෙම සිදුවීම සම්බන්ධයෙන් ඔහුගේ පාර්ශවයේ තොරතුරු ඉදිරිපත් කොට තිබිණි. එසේම එම ලිපිය තුළ, එම සිදුවීම් මාලාව සම්බන්ධයෙන් මැ.කො.ස.දේශප්‍රිය විසින් මැයි 20 දින දිවයින පුවත්පතට යැවූ නිල ප්‍රකාශයක් අන්තර්ගත විණි.

මේ පිළිබඳව තතු මෙසේ නම්, මැයි 31 ඉරිදා මව්බිම පුවත්පතේ මෙන්ම සිලෝන් ටුඩේ පුවත්පතේද, හූල් සම්බන්ධයෙන් විවේචන දැක්වී තිබෙන පුවත් තුළ, හූල්ගේ පාර්ශවයෙන් දැක්වුණු කරුණු හෝ මැ.කො.ස. විසින් නිල වශයෙන් ඉදිරිපත් කළ කරුණු සඳහන් වී නැත්තේ මන්ද? මෙම චෝදනා සම්බන්ධයෙන් මහාචාර්ය හූල්ව සම්බන්ධකරගනිමින් කිසිදු ප්‍රකාශයක් ලබාගෙන හෝ ලබාගන්නට උත්සාහ කොට නොමැත්තේ මන්ද? මෙසේ ඒකපාර්ශ්විකව කරනා කරුණු දැක්වීම් වගකීම් සහගත ජනමාධ්‍යකරණයක් ලෙසින් ගණන් ගැනීමට හැකිද? එය පාඨකයාවද නොමඟ යවන සුළු නොවන්නේද?

කලම්බු ටෙලිග්‍රාෆ් ලිපිය ඔස්සේ හූල් විසින් ඉදිරිපත් කළ ප්‍රකාශය: [https://www.colombotelegraph.com/index.php/elilini-hoole-defamation-by-several-news-outlets/](https://www.colombotelegraph.com/index.php/elilini-hoole-defamation-by-several-news-outlets/)

#SinhalaPress #MediaEthicsSL #News #lka #SundayMawbima #CeylonToday